# 2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම.

2023 වර්ෂයේ ඔක්තෝම්බර් මස 04 දින තීරණ අංක 598 යටතේ 1987 අංක15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තිය ලැබී ඇති බලතල ප්‍රකාර,ඒ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ කිසියම් කර්මාන්තයක් වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේදි කරගෙන යනු ලබන අවස්ථාවක,ඒ කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මත කර්මාන්ත පිළිබඳ බද්දක් පනවා අය කිරීමට කටයුතු කරනු ලබයි. එම බද්ද 2024 අප්‍රේල් මස 30 වන දිනට පෙර වැලිමඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වේ.

| 1 වන තීරුව | 11 වන තීරුව |
|---|---|
| **1-** වාර්ෂික වටිනාකම රු:750.00 නොඉක්මවන අවස්ථාවක | **රු:500.00** |
| **2-** රු: 750 ඉක්මවන එහෙත් රු:1500 නොඉක්මවන අවස්ථාවක | **රු:750.00** |
| **3-** රු:1500 ඉක්මවන අවස්ථාවක | **රු.1000.00** |

<u>කර්මාන්ත බදු ගෙවිය යුතු කර්මාන්ත ලැයිස්තුව</u>

01. තේ/ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
02. බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
03. මහමාර්ග තැනීමට අවශ්‍ය ගල්තාර කොන්ක්‍රීට් මිශ්‍රණය නිෂ්පාදනය කිරීම.
04. සඳුන් තෙල් නිෂ්පදනය හා විකිණීම.
05. කරණවැම්හල් සඳහා රසායන ද්‍රව්‍ය භාවිතා කොට කොලොන් වර්ග නිෂ්පාදනය හා විකිණීම.
06. කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
07. මල් අතු රිකිලි නිෂ්පාදනය කිරීම.
08. මල් අතු රිකිලි නිෂ්පාදනය ට උචිත පරිදි මල් බඳුන් සැකසීම.
09. කැපුම් මල් සෑදීම/ මල් පැල විසිතුරු පැල
10. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරුම් හලක් හා ලී මෝලක් පවත්වාගෙන යාම.
11. කෝපි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
12. ලිහිසි තෙල් ගබඩා කිරීම හා විකිණීම.
13. දැන්වීම් පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම(ඩිජිටල් ප්‍රින්ටර්)